**නිමැවුමේ ස්වභාවය**

ළමා ඉතුරුම් ගිණුමකි.

**ගනුදෙනුකරුට ලැබෙන ප්‍රතිලාභ**

- සාමාන්‍ය ඉතුරුම් ගිණුමට වඩා වැඩි පොලියක්.
  (නවතම පොලී අනුපාත පිළිබඳ දැනගැනීම සඳහා,
  https://www.peoplesbank.lk/interest-rates/ වෙබ් අඩවිය වෙත පිවිසෙන්න)
- දිනපතා ගණනය වන පොලිය මාසිකව ගිණුමට බැර වීම.
- ගිණුමේ ශේෂයෙහි වර්ධනය මත ඉසුරු උදාන ගිණුම් හිමියන් වෙත සුවිශේෂී වූ ත්‍යාග රටාවක්
- ඉසුරු උදාන තැගි වවුචර මගින් ගිණුම් විවෘත කිරීමට හැකිවීම සහ දැනට පවතින ගිණුමක් සඳහා ඉසුරු උදාන තැගි වවුචර පත් බැර කිරීමට හැකිවීම.
- වර්ෂය තුල උපදින දරුවන් සඳහා රු.1000/- ක් වටිනා තිළිණපතක් බැංකුව මගින් තිළිණ කරනු ලබයි. මෙම තිළිණපත ඉසුරු උදාන ගිණුමක් විවෘත කිරීම සඳහා යොදා ගත හැක. මෙම මුදල සහ අදාල අනෙකුත් ප්‍රතිලාභ කලින් කලට වෙනස් වීමට යටත් වේ.

**ආරම්භක තැන්පතු හා ගාස්තු**

- සිසු උදාන ගිණුමක් අලුතින් විවෘත කිරීමේදී රු.250/- ක මූලික තැන්පතුවක් ගිණුම වෙත බැංකුව විසින් පිරිනමනු ලබයි.
- ගිණුමට අදාළ බදු, සේවා සහ අනෙකුත් ගාස්තු කලින් කලට වෙනස්වීමට යටත්වේ. ඒ පිළිබඳ දැනගැනීම සඳහා බැංකුවේ නිල වෙබ් අඩවිය පරිශීලනය කරන්න.
  **www.peoplesbank.lk**

**සුදුසුකම්**

- වයස අවුරුදු 0-5 අතර ශ්‍රී ලාංකික පුරවැසි දරු දැරියන් සඳහා සිසු උදාන ගිණුම විවෘත කළ හැකිය.

**ගිණුම විවෘත කිරීම සඳහා අනුගමනය කළ යුතු පියවර.**

- සිසු උදාන ගිණුමක් විවෘත කිරීම සඳහා බැංකුව නිකුත් කරනු ලබන නිත්‍ය මැන්ඩේට්පත නිවැරදිව සම්පූර්ණ කර පහත සඳහන් ලියකියවිලි සමඟ ශාඛාව වෙත ඉදිරිපත් කළ යුතුය.
  - දරුවාගේ උප්පැන්න සහතිකයේ පිටපත.
  - මව / පියා හෝ භාරකරුගේ ජාතික හැඳුනුම්පතේ පිටපත(NIC).
    ජාතික හැඳුනුම්පත නොමැති අවස්ථාවකදී, වලංගු ගමන් බලපත්‍රයේ පිටපත (ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් විය යුතුය) හෝ වලංගු රියදුරු බලපත්‍රයේ පිටපත (ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් විය යුතුය) භාවිතා කළ හැක.
  - ලිපිනය තහවුරු කිරීමේ ලියවිලි (මැන්ඩේට්පතෙහි සඳහන් කරනු ලබන ලිපිනය උප්පැන්න සහතිකයේ/ජාතික හැඳුනුම්පතේ සඳහන් ලිපිනයට වෙනස් වන්නේ නම් පමණක් මෙය ඉදිරිපත් කළ යුතුය).

PEOPLE'S BANK
Pride of the Nation

## ප්‍රධාන නියම සහ කොන්දේසි

- ගිණුමට අදාළ කොන්දේසි වරින් වර වෙනස් විය හැක.
- ගිණුමට අදාළ සියලු නියමයන් සහ කොන්දේසි පිළිබඳ දැනුවත් වීම සඳහා ගිණුම විවෘත කිරීමේ මැන්ඩේට්පත පරිශීලනය කරන්න.

මීට අදාළ නවතම තොරතුරු දැනගැනීමට ඔබට ආසන්න මහජන බැංකු ශාඛාව අමතා හෝ මහජන බැංකු නිල වෙබ් පිටුව වෙත පිවිසෙන්න.https://www.peoplesbank.lk/